# ලංසු සඳහා ආරාධනයයි!
# දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.

## විශේෂ හා සාමාන්‍ය සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම.

දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති විසින් දකුණු පළාතේ පොදු මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මහජන නියෝජිතයින්, බහුජන සංවිධාන, මගී ඉල්ලුම හා රටේ සංවර්ධන අවශ්‍යතා අනුව අධිකාරිය විසින් පරීක්ෂා කර, හඳුනාගත් මාර්ග සඳහා සාමාන්‍ය බස් සේවා වාර්ෂිකව ලංසු මුදල ගෙවීමේ පදනම යටතේ නව මගී ප්‍රවාහන බලපත්‍ර 04ක් නිකුත් කිරීමට, යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන්, මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. විශේෂ හා සාමාන්‍ය සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර සඳහා ලංසු පිරිනැමීමේ අයිතිය අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතුය. මෙම බලපත්‍ර වාර්ෂික බලපත්‍ර ලෙස නිකුත් කරනු ලබන බැවින් සෑම වර්ෂයක් අවසානයේදීම බලපත්‍ර ලබා ගැනීමට ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු මුදල ගෙවා වාර්ෂිකව බලපත්‍රය ලබා ගතයුතු වේ. ලංසු සඳහා ආරාධනා කරනු ලබන මාර්ග පහත පලකරනු ලබන අතර, සෑම බස් සේවාවක් සඳහාම පහත ලේඛනයේ සඳහන් අනුමත ආසන ධාරිතාවයෙන් යුතු බස්රථ ඉදිරිපත් කල යුතුය. ලංසුකරණය, ජාතික තරඟකාරී ලංසුකරණ කැඳවීම (NCB) යටතේ ලංසු ආරාධනා කැඳවනු ලැබේ.

- වෙන් වෙන් වශයෙන් එක් ලංසුවකට රු.25,000/- බැගින් ආපසු ගෙවනු ලබන ඇප මුදලක් තැන්පත් කල යුතුය.
- ලංසු සඳහා ආරාධනය කරනු ලබන සෑම මාර්ගයක් වෙනුවෙන්ම නියමිත කාලසටහන් හා ගාස්තු සටහන් සකස් කර ඇති අතර ලංසු ලේඛනය තුල අයදුම්පත්‍ර සමග කාලසටහන් හා ගාස්තු සටහන් විස්තර ලබා දෙනු ලැබේ.

ලංසු තැබීම මගින් ලබාදෙනු ලබන මාර්ග වල ගමනාන්ත අනෙකුත් බස් සේවාවන්ට වන බලපෑම හා නීතිමය කරුණු මත දීර්ඝ කිරීමක් හෝ වෙනත් මාර්ග සඳහා සංශෝධනය කිරීමක් සිදු කරනු නොලැබේ. මෙම මාර්ගවල මගී අවශ්‍යතාවය මත බස් සේවා තර කිරීමේදී ශ්‍රී ලංගම සමග (60%-40%) පදනම මත අනාගතයේ බස් සේවා තර කිරීම සිදු කෙරේ. ඒ අනුව මාර්ග පරීක්ෂා කර බස් සේවා පවත්වාගෙන යාමේ හැකියාව සලකා බලා පමණක් ලංසු වටිනාකම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමි. මගී සේවා පිළිබඳ අවබෝධයකින් තොරව බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉහල මිල ගණන් ඉදිරිපත් කොට ඒ මත පසුව අභියාචනා කිරීමේ අයිතියක් ඉල්ලුම්කරුට නොපවතී.

ටෙන්ඩර් හිමිකම ලබාගැනීමෙන් පසු දින 60 ක කාලය ඇතුලත බලපත්‍රය ලබාගෙන බස් සේවාව ආරම්භ කල යුතු අතර, එම කාලය දිර්ඝ කිරීමක් සිදු කරනු නොලැබේ. එහි වගකීම බලපත්‍රය ලබා ගත් තැනැත්තා විසින් දැරිය යුතුය.

ලංසු ආරාධනාවට අදාල උපදෙස්, නියමයන් හා කොන්දේසි අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කරන බැවින් ඒ පිළිබඳ අවබෝධයකින් යුතුව ලංසුකරු ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කල යුතුවේ.

## ලංසු තැබීම සඳහා ඉදිරිපත් කරනු ලබන මාර්ග විස්තර

| සාමාන්‍ය මගී ප්‍රවාහන බස් සේවා බලපත්‍ර | | | | |
|---|---|---|---|---|
| ලංසු යොමු අංකය | මාර්ග අංකය | සේවාව | අනුමත ආසන ධාරිතාව | වාර්ෂික අවම ලංසු වටිනාකම රු. |
| 2025/OPR/DEV/FI/01 | 371/1 | වැලිගම- වලාන රෝහල - මුදුගමුව - රණමයුරගම - නාකන්ද - කෝංගස්හේන -දිගරුද්ද - අහංගම | 26-28 | 93240.00 |
| 2025/OPR/DEV/FI/02 | 375/7 | කොටපොල - කොස්මෝදර- බෝදෙණිය-ගොඩකුඹුර-දෙනියාය | 26-28 | 72240.00 |
| 2025/OPR/DEV/FI/03 | 503/2 | සමාධිගම - රොටවල - 1 කණුව - අම්බලන්තොට | 26-28 | 63840.00 |
| 2025/OPR/DEV/FI/04 | 368/7 | පිටබැද්දර - සියඹලාගොඩ - මහපොතුවිල | 26-28 | 76608.00 |

1. අභිලාශී ලංසුකරුවන්ට සිංහල භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් ඉහත දක්වා ඇති එක් එක් ලංසු ආරාධනයන්හි වෙන් වෙන් වශයෙන් සඳහන් ලංසු සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් දෙදහසක (රු.2,000/- ක) අයදුම්පත්‍ර ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව 2025/07/17 වන දින සිට 2025/08/21 දින දක්වා කාර්යාල දිනයන් තුල පෙ.ව. 8.30 සිට ප.ව 3.00 දක්වා ධාවන අංශයෙන් මිලදී ගත හැකිය.
2. අභිලාශී යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු හා ලංසු ලිපි ලේඛන කාර්යාල වේලාව තුල අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදි නොමිලේ පරීක්ෂා කිරීම සිදු කල හැකිය.
3. ලංසු ඉදිරිපත් කලයුතු අවසාන දිනය 2025 අගෝස්තු මස 22 වන දින 1130 පැය වන අතර එදින 1200 පැයට අධිකාරියේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාරයේදී ලංසු විවෘත කරනු ලැබේ.
4. නිසි පරිදි සම්පූර්ණ කර, මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් "අනුපිටපතකින්" යුක්තව ලියාපදිංචි තැපෑලෙන් ගාල්ල, කොටුව, ලේන්බාන් විදීය, නො.67හි පිහිටි දකුණු පළාත්

මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙන සේ යොමු කිරීම හෝ අධිකාරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම ලංසු ලබා ගන්නා අවසන් වේලාවට හෝ ඊට පෙර සිදු කල යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඊට අදාල යොමු අංකය සමග යොමු කරන බස් සේවාව "සාමාන්‍ය බස් සේවා බලපත්‍ර -2025" ලෙසද සඳහන් කල යුතුය.

5. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු බව දැනුම් දෙනු ලැබේ. මෙම නියෝගය කඩ කරනු ලබන අයදුම්කරුවන්ගේ ලංසු අයදුම්පත විවෘත කරනු නොලැබේ. ඕනෑම ලංසුවක් පිලිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

මුලික තොරතුරු දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සියළුම දිස්ත්‍රික් කාර්යාල වලින් හෝ අංක : 67, ලේන්බාන් විදිය, කොටුව, ගාල්ල ලිපිනයෙන් හෝ www.sprpta.lk වෙබ් අඩවියෙන් හා දුරකථන අංක 091- 2234237/091-2227074 මගින් විමසිය හැකිය.

එම්.බී.චන්ද්‍රනිමල්
සභාපති
ද.ප.මා.ම.ප්‍රවාහන අධිකාරිය
ගාල්ල.
2025/07/17